# 13. මිගලුද්දකො

## තෙරසමො පාඨො



**අම්හාකං කිර භගවතො පුබ්බෙ ලොකපජ්ජොතො ලොකනයනො** ලොකත්තාණො කස්සපො නාම භගවා ලොකෙ උදපාදි, සදෙවකං ලොකං නිබ්බාණපුරං පාපෙන්තො. තස්මිං සමයෙ පච්චන්තගාමවාසිකො එකො මනුස්සො වනෙ මිගසූකරාදයො බන්ධිත්වා වජෙ කත්වා තෙ පොසෙන්තො, නිච්චං පාණාතිපාතං කත්වා, ජීවති. අපරභාගෙ සො පිණ්ඩායචරමානං එකං භික්ඛුං දිස්වා ගන්ත්වා, තස්ස **<u>හත්ථමහා</u>** **<u>පත්තං ගහෙත්වා</u>** තං අත්තනො ගෙහං නෙත්වා පඤ්ඤත්තාසනෙ නිසීදාපෙත්වා, මිගසූකරමද්දවං උපනෙත්වා, භොජෙත්වා, දිවා මංසරසපිණ්ඩපාතං දත්වා, භුත්තාවසානෙ එකමන්තං නිසීදි.

**(රසවාහිනී සූරනිමලකථාවත්ථු)**

## වචන මාලාව

1. ලොකපජ්ජොත - ලොවට පහණක් බඳු
2. ලොකතාණ - ලොවරක්නා
3. වජෙ කත්වා - ගාල්කොට
4. ලොකනයන - ලෝකයට ඇසක් වූ
5. පාපෙති - පමුණුවයි
6. පච්චන්තගාමවාසී - පසල් ගමක වසන
7. පඤ්ඤත්තාසන - පැන වූ ආසනය
8. නිසීදාපෙති - හිඳුවයි
9. මිගසූකරමද්දව - මුව හා ඌරු මස්
10. උපනෙත්වා - ගෙනවිත්
11. භොජෙත්වා - අනුභව කරවා
12. එකමන්තං - එකත්පසෙක
13. මිගලුද්දකො - මුව වැද්දා
14. සුමෙ - හෙට

## පඤ්චමී විභක්තිය

ඉහත පාඩමේ ඉරි ඇඳි පදය යෙදී ඇත්තේ පඤ්චමී විභක්තියෙනි.

**පුරිසො තස්ස <u>හත්ථම්හා</u> පත්තං ගහෙත්වා දානං දදාති.**

(පුරුෂයා ඔහුගේ අතින් පාත්‍රය ගෙන දානය දෙයි.)

- වෙන්වීමක් සිදුවන්නේ යමකින් ද එය, පඤ්චමී විභක්තියෙන් තැබිය යුතු ය.
- බියවීමක් කියවෙන විට බියට හේතුවන පදය ද, පඤ්චමී විභක්තියෙන් තබයි.

- ''ගෙන්, කෙරෙන්'' යන අදහස් මෙහි ඇත.

**පඤ්චමී විභක්තිය යෙදී ඇති මේ වාක්‍ය බලන්න.**

- රුක්ඛම්හා ඵලං පතති - ගසෙන් ගෙඩිය වැටෙයි.
- මිගො සීහම්හා භායති - මුවා සිංහයාගෙන් බිය වෙයි.
- සො පාපා විරමති - හෙතෙම පවින් වැළකෙයි.
- සුරියො පබ්බතම්හා උදෙති - හිරු පර්වතයෙන් උදාවෙයි.
- වානරො රුක්ඛම්හා රුක්ඛං පක්ඛන්දති - වඳුරා ගසෙන් ගසට පනියි.

| පඤ්චමී විභක්තිය | | |
|---|---|---|
| නාමය | ඒකවචන | බහුවචන |
| බුද්ධ | බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා | බුද්ධෙහි, බුද්ධෙභි |
| අග්ගි | අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා | අග්ගීහි, අග්ගීභි |
| දණ්ඩී | දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩීහි, දණ්ඩීභි |
| භික්ඛු | භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා | භික්ඛූහි, භික්ඛූභි |
| කඤ්ඤා | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| නදී | නදියා, නජ්ජා | නදීහි, නදීභි |
| චිත්ත | චිත්තා, චිත්තම්හා, චිත්තස්මා | චිත්තෙහි, චිත්තෙභි |
| සබ්බ | සබ්බම්හා, සබ්බස්මා | සබ්බෙහි, සබ්බෙභි |
| ඉම | අස්මා, අම්හා, ඉමම්හා, ඉමස්මා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |

## අභ්‍යාසය 13 1

1. සිංහලයට නගන්න.

    1. මූසිකො බිළාලම්හා භායති.
    2. මනුස්සා රුක්ඛම්හා පතති.
    3. ත්වං කම්හා භායසි?
    4. සකුණා පබ්බතම්හා උඩ්ඩෙන්ති.
    5. අහං ආරාමම්හා පරිවෙණං ගමිස්සාමි.

2. පා ලියට නගන්න.

    1. මම අලියාගෙන් භය වෙමි.
    2. තවුසා උපාසකයාගෙන් පාත්‍රය ගනියි.
    3. චන්ද්‍රයා කුමකින් පායයි ද?
    4. කුමාරයෝ ප්‍රාසාදයෙන් නික්මෙති.
    5. තෙරුන්වහන්සේ හෙට පන්සලට වඩින සේක.

3. ඔබ දන්නා පඤ්චමී විභක්ත්‍යන්ත පද යොදා වගන්ති පහක් නිර්මාණය කරන්න.

4. පාඩමේ එන ඡේදය සිංහලට නගන්න.

**මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න**

| අකාරාන්ත නපුංසක ලිංග ''චිත්ත'' ශබ්දය (සිත) | | |
|---|---|---|
| විභක්තිය | ඒකවචන | බහුවචන |
| පඨමා | චිත්තං | චිත්තා, චිත්තානි |
| ආලපන | (හෙ) චිත්ත, චිත්තා | (හෙ) චිත්තෙ, චිත්තානි |
| දුතියා | චිත්තං | චිත්තෙ, චිත්තානි |
| තතියා | චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| කරණ | චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| චතුත්ථී | චිත්තාය, චිත්තස්ස | චිත්තානං |
| පඤ්චමී | චිත්තා, චිත්තම්හා,<br>චිත්තස්මා | චිත්තෙහි, චිත්තෙභි |
| ඡට්ඨී | චිත්තස්ස | චිත්තානං |
| සත්තමී | චිත්තෙ, චිත්තම්හි,<br>චිත්තස්මිං | චිත්තෙසු |